**දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව - 2023**

**------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ,මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුල ශුද්ධ පොත් අගය රු.46,981 ක් වූ පරිගණකයක් සහ රු.103,656 ක් වූ බඩුන් හා උපකරණ අලෙවියෙන් ලද අලාභය පිළිවෙලින් රු.46,381 ක් සහ රු.98,261 ක් මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කර නොතිබුණි. | මෙම මුදල තැන්පත්වලින් නිදහස් කර ආදායමට ගැනීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය ලද ප්‍රාග්ධන ප්‍රදාන රු.14,079,510 ක් වුවද, එය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ රු.100,421,017 ක් ලෙස දක්වා තිබුණි. | සමස්ථ මූල්‍ය ප්‍රකාශනවලට මෙමගින් බලපෑමක් වී නොමැති බව. | ප්‍රාග්ධන ප්‍රදාන , විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ නිවැරදිව දැක්විය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.19,483,543 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.23,401,881 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස් කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස් කළ ආදායම | 2022 දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 5,650,000 | 5,918,307 | 5,388,770 | 915,621 | 15,455,600 | 14,785,167 | 13,682,609 | 1,102,558 |
| (ii) | කුලී | 1,468,200 | 1,440,600 | 1,440,350 | 37,800 | 2,735,600 | 2,193,940 | 2,156,390 | 37,550 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,550,000 | 1,628,800 | 1,630,750 | - | 500,300 | 318,850 | 318,500 | - |
| (iv) | වෙනත් ආදායම් | | | | | 129,300,078 | 211,451,934 | 148,159,403 | 63,292,531 |
| | | 8,668,200 | 8,987,707 | 8,459,870 | 953,421 | 147,991,578 | 228,749,891 | 164,316,902 | 64,432,639 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු කාල විශ්ලේෂණය අනුව වරිපනම් හිමියන් 175 දෙනෙකුගෙන් වර්ෂ 01 ත් 02 ත් අතර කාලයක සිට අයවිය යුතු හිඟය රු.175,246 ක් ද , වරිපනම් හිමියන් 49 දෙනෙකුගෙන් වර්ෂ 02 ත් 03 ත් අතර කාලයක සිට රු.63,889 ක්ද, වරිපනම් හිමියන් 44 දෙනෙකුගෙන් වර්ෂ 03 ත් 05 ත් අතර කාලයක සිට රු.61,242 ක්ද, වරිපනම් හිමියන් 65 දෙනෙකුගෙන් වර්ෂ 05 ට වැඩි කාලයක සිට පවතින හිඟය රු.187,281 ක්ද විය. | අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) වෙනත් ආදායම්** | | |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.8,470,087 ක් හා මුද්දර ගාස්තු රු.82,076,795 ක් විය. | අයකළ යුතු මුදල කඩිනමින් ලබා ගැනීමට කටයුතු කරන බව . | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) බදු ගිවිසුමේ කොන්දේසි අංක 03 යටතේ මාසික බදු කුලී මුදල ගෙවිය යුතු ආකාරය සඳහන් කර තිබුණද ගිවිසගනු ලබන මාසික කුලිය කොපමණද යන්න දක්වා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කරන බව. | බදු ගිවිසුම් නිවැරදිව සකස් කළ යුතුය. |
| (ආ) දොඩන්ගොඩ පොදු වෙළඳ සංකීර්ණයෙහි කඩ කාමර අංක 12 සහ 13 නියමිත පැවරුම් ගාස්තු අය කර බදු අයිතිය සංශෝධනය කිරීම සඳහා 2023 ජුනි 27 දිනැති කළමනාකරණ කමිටු අනුමැතිය ලැබී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පැවරුම් ගාස්තු අය කර ගිවිසුම්ගත වීම සඳහා කටයුතු කර නොතිබුණි. | 2024.06.06 දිනට පෙර කඩ කාමර පැවරුම් ගාස්තු ගෙවනු නොලැබුවහොත් නව බදුකරුවන් වෙත කඩ කාමර ලබාදීමට පියවර ගන්නා බව. | පැවරුම් ගාස්තු අයකර ගිවිසුම්ගත විය යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සපුගහවත්ත පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක 14 හි මාස 10 ක හිඟ කුලිය වූ රු.25,000 ක් සමාලෝචිත වර්ෂය අවසානයේත් අය කර නොතිබුණි. | 2024 වර්ෂය අවසන් වීමට පෙර අයකර ගැනීමට කටයුතු කරන බව. | ගිවිසුම් ප්‍රකාරව කඩකුලී අය කළ යුතුය. |
| (ආ) රු.4,954,698 ක් වැය කර ඉදි කරන ලද හෙළ බොජුන්හල 2023 සැප්තැම්බර් මස සිට නිශ්කාර්යව පවතින අතර පෙර බදුකරු විසින් ගෙවිය යුතු හිඟ කුලී රු.125,000 ක් සහ හිඟ විදුලි බිල් රු.32,000 ක් සමාලෝචිත වර්ෂය අවසානයේත් අය කරගෙන නොතිබුණි. | 2024.07.31 දිනට පෙර ඵලදායි කාර්යයකට යෙදවීමට පියවර ගනිමි. නීතිමය කටයුතු සිදු කරන බව. | -එම- |
| (ඇ) දොඩන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය යටතේ ලියාපදිංචි හෝටල් 05 ක් පැවතියද බලපත්‍ර ගාස්තු අය කළ යුතු ලෙස එක් නිකේතනයක් පමණක් හඳුනාගෙන තිබූ අතර ඉතිරි සංචාරක හෝටල් 04 පිළිබඳ සමීක්ෂණයක් සිදු කර භෞතික පැවැත්ම තහවුරු කොට ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට පියවර ගන්නා බව. | සභාවට ලැබිය යුතු ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

3.3 **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| නිවාඩු නිකේතනයක් දීර්ඝ කාලයක සිට බලපත්‍ර ලබා ගැනීමකින් තොරව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන ගියද ඒ බව නොසලකා එම ආයතනයේ අළුතින් ඉදි කරන ලද ගොඩනැගිලි සඳහා වූ සැලසුම් 2019 වර්ෂයේදී සභාව විසින් අනුමත කර තිබුණු අතර 2022 වර්ෂයේදී එම ගොඩනැගිල්ල සඳහා අනුකූලතා සහතිකයද නිකුත් කර තිබුණි. | ඉදිරියේදී මෙවැනි ප්‍රමාදයන් නොවීමට පියවර ගන්නා බව. | නිති,රීතිවලට අනුකූල නොවන ආයතනවලට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |

3.4 **වත්කම් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| (අ) සභාව සතු ඉඩම් 143 න් ඉඩම් 54 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | මෙම කටයුතු 2024 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිම කරන බව. | සභාව සතු වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) 2017 වර්ෂයේ සිට භාවිතා කරන සභාව සතු ට්‍රැක්ටර් රථය හා බවුසරය සභාව නමට පවරා ගෙන නොතිබුණි. | පවරා ගැනීම සඳහා වන ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව. | සභාව සතු වත්කම් පවරා ගත යුතුය. |
| (ඇ) 2016 වර්ෂයේ සිට අක්‍රියව පවතින මෝටර් ග්‍රේඩරය අපහරණය කිරීම සඳහා 2023 මැයි මස තක්සේරු කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන තුරුත් අපහරණය කර නොතිබුණි. | 2024.08.31 දිනට පෙර මෙම කටයුතු අවසන් කිරීමට කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර ඇති බව. | නිශ්ක්‍රිය වත්කම් අපහරණය කළ යුතුය. |

3.5 **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් මස කසළ අංගනයේ ගබඩාව ඉදි කිරීමට අදාලව පිරිවැය ඇස්තමේන්තු සැකසීමේදී 2023 ජුනි 13 දින බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ද්‍රව්‍ය මිල ගණන් උපලේඛනයේ රේට අදාල කර නොගැනීමෙන් කොන්ත්‍රාත්කරුට රු.59,929 ක් වැඩියෙන් ගෙවා තිබුණි . | ඉදිරියේදී මෙවැනි ප්‍රමාදයන් නොවීමට පියවර ගන්නා බව. | නිවැරදි රේට අනුව ඇස්තමේන්තු සැකසිය යුතුය. |